# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය

සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு

சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

**Ministry of Finance**

State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No  DSD/HO/02/Ad/05/SDO/EB/2020 | ඔබේ අංකය<br>உமது இல<br>Your No ............................................ | දිනය<br>திகதி<br>Date  2020.12.21 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පැවැත්වෙන I වන</u>**
**<u>කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ වෙත යොමු කර ඇති මගේ සමාංක හා 2020.12.04, 2020.12.10 දිනැති කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 සම්බන්ධ නිවේදන වලට අමතර වශයෙනි.

02. ඉහත නිවේදන මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි උක්ත විභාගය 2021 ජනවාරි මස 23 වන සෙනසුරාදා දිනයේ දී දිස්ත්‍රික්ක මට්ටමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

03. වර්තමානයේ රටතුළ පවතින තත්ත්වය හමුවේ අයදුම්කරුවන් විසින් තැපෑලෙන් එවනු ලබන විභාග අයදුම්පත්‍ර ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමේදී යම් ප්‍රමාදයක් සිදුවන බව නිරීක්ෂණය වී ඇත. ඊට විසඳුම් ලෙස 2020.12.04 දිනැති මාගේ ලිපිය මඟින් විද්‍යුත් තැපෑලෙන් ද එම අයදුම්පත්‍රය යොමු කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

04. ඉහත විභාගය සඳහා ඔබ දිස්ත්‍රික්කයෙන් පෙනීසිටීමට නියමිත නිලධාරීන්හට සුදානම් වීමේ ආරම්භක පියවරක් ලෙස දින දෙකකදී සම්මන්ත්‍රණ වැඩසටහන් තුනක්, 2020.12.30 හා 31 යන දිනවලදී ZOOM තාක්ෂණය මඟින් ප්‍රධාන කාර්යාලයේ සිට පැවැත්වීමට නියමිතය. එම නිසා ඔබ දිස්ත්‍රික්කයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට නියමිත නිලධාරීන්හට එම සම්මන්ත්‍රණ සඳහා සහභාගිවීමට අවශ්‍ය උපදෙස් කඩිනමින් ලබාදෙන මෙන් ද කාරුණිකව දැනුවත් කරමි.

05. මෙම සම්මන්ත්‍රණ වැඩසටහන් සංවිධානය කිරීමේදී පහත දක්වා ඇති කරුණු පිළිබඳ ඔබගේ අවධානය යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

- වැඩසටහන් සඳහා සහභාගිවන නිලධාරීන් සංඛ්‍යාව අනුව ඒ සඳහා සුදුසු පහසුකම් ඇති ස්ථානයක් තෝරාගැනීම.
- ZOOM තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන මෙම සම්මන්ත්‍රණය අවසානයේ දී ඒ ඇසුරෙන් මතුවන ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට / සමාලෝචනය කිරීමට ඒ ඒ විෂයයන් සඳහා සුදුසු සම්පත් දායකයින්ගේ සහාය ලබා ගැනීමට කටයුතු කිරීම. ඒ සඳහා සම්පත්දායක දීමනාව ගෙවනු ඇත.
- සහභාගිවන සංඛ්‍යාවට ප්‍රමාණවත් වන පරිදි Multimedia, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ යොදාගැනීම.
- ඉහත වැඩසටහනට සම්බන්ධවීමට අවශ්‍ය ZOOM Link එක Samu.Exe.Meeting Group වෙත ලබාදීමට කටයුතු කෙරේ.
- මෙම වැඩසටහන් සංවිධානය කිරීමේ දී ඔබේ පහසුව සඳහා ඔබ කාර්යාලයේ වගකිව යුතු නිලධාරියකු නම් කර එම නිලධාරියාගේ දුරකථන අංකය, Whats App හා විද්‍යුත් තැපැල් ලිපිනය ලබාදීම.
- සෞඛ්‍ය බලධාරීන් විසින් ලබා දී ඇති <u>**සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුව**</u> වැඩසටහන් සංවිධානය කිරීම.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

06. තවද ඔබ දිස්ත්‍රික්කයේ **කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අයදුම්කර ඇති** මෙම සම්මන්ත්‍රණවලට සහභාගිවීමට නියමිත නිලධාරින්ගේ සවිස්තර වාර්තාවක් පහත සඳහන් ආකෘතියට අනුව සකස්කර විද්‍යුත් තැපැල මඟින් 2020.12.28 දිනට පෙර මා වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් ද කාරුණිකව දන්වමි. (විද්‍යුත් තැපැල් ලිපිනය - adsamurdhi2014@gmail.com)

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | මුලකුරු සමඟ අයදුම්කරුගේ නම | ජාතික හැඳුනුම්පත් අංකය | ජංගම දුරකථන අංකය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

07. මෙම වැඩමුළු / සම්මන්ත්‍රණ සංවිධානය කිරීමේදී වැයවන මුදල ඇස්තමේන්තුගත කර කඩිනමින් මා වෙත එවන ලෙස ද වැඩිදුරටත් දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

01. ලේකම්, සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.
03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස. හා අ.ක.ස.